Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## 9 දත්ත සමුදාය.

### 9.4 සරල සම්බන්ධිත දත්ත පාද සැලසුම් කරයි.

#### ශිෂ්‍ය කාර්ය

- ඔබගෙ කියවීම් පොතෙහි පිටු අංක 281 සිට 288 දක්වා කියවා හොඳින් තේරුම් ගන්න.
- වගු, ක්ෂේත්‍ර යතුරු ප්‍රථමික යතුරු ආගන්තුක යතුරු හා සංයුක්ත යතුරු නිරීක්ෂණය කර හොඳින් අවබෝධ කරගන්න.
- මෙහි දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මඟින් පාඩමට අදාළ ඉගැන්වීම් පාඩම් ලබාගෙන ඉගෙන ගන්න.

#### මෙම පාඩමට අදාලව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක

- e-nenapiyasa https://drive.google.com/file/d/1CogHTKfCkX63AAUHkJm0TctVFFq1Lrz7/view
- Youtube https://www.youtube.com/watch?v=DG-r09xWF5s

#### මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල

- වගු, ක්ෂේත්‍ර යතුරු ප්‍රථමික යතුරු ආගන්තුක යතුරු හා සංයුක්ත යතුරු වල කාර්යය විස්තර කරයි.
- සරල සම්බන්ධිත දත්ත පාද සැලසුම් වල ස්වභාවය හඳුනා ගනී.

## ඇගයීම් / තක්සේරු කරන ක්‍රමවේදය

- ඔබ ඉගෙන ගත් වගු, ක්ෂේත්‍ර යතුරු ප්‍රථමික යතුරු ආගන්තුක යතුරු හා සංයුක්ත යතුරු වල ස්වභාව ලියා දක්වන්න.

පාසලක දත්ත සමුදායක ක්‍රීඩා භාණ්ඩ සම්බන්ධව වූ ක්‍රීඩා භාණ්ඩ වගුව , ශිෂ්‍ය වගුව හා ක්‍රීඩා භාණ්ඩ ලබා ගන්නා වූ වගුව සලකා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| ITEM-ID | SPORT ITEM | RECEIVED DATE |
|---|---|---|
| 101 | වොලිබෝල් | 01/02/2021 |
| 102 | ක්‍රිකට් පිති | 01/02/2021 |
| 103 | වොලිබෝල් | 02/02/2021 |

ක්‍රීඩා භාණ්ඩ වගුව

| S-ID | NAME | GRADE |
|---|---|---|
| S01 | නිපුනි | 10 |
| S02 | චමත් | 08 |

ශිෂ්‍ය වගුව

| DATE | ITEM-ID | S-ID |
|---|---|---|
| 15/06/2021 | 101 | S01 |
| 18/06/2021 | 102 | S02 |
| 22/06/2021 | 101 | S01 |

ක්‍රීඩා භාණ්ඩ ලබා ගන්නා වූ වගුව

1. ඉහත දත්ත සමුදායේ ප්‍රාථමික යතුරු 02 ක් ඒවායේ වගුවල නම් ද සමඟ ලියා දක්වන්න
2. ඉහත දත්ත සමුදායේ ආගන්තුක යතුරක් අදාළ වගුවේ නම සමඟ ලියා දක්වන්න.
3. 2016/06/30 දින පාසලට අලුතින් පරිත්‍යාගයක් ලෙස නෙට්බෝලයක් ලැබුණි. දත්ත සමුදායේ කුමන වගුව යාවත්කාලීන විය යුතුද?